සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 07 - 2023

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

01. ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයන් වන්නේ,
   i. ජාකොබ්, ඇන්ඩෘ, පිලිප්, මතෙව්
   ii. ජුවාම්, පේදුරු, ජාකොබ්, තෝමස්
   iii. ජුදාස්, පේදුරු, මතෙව්,ඇන්ඩෘ
   iv. පේදුරු, ඇන්ඩෘ, ජාකොබ්, ජොහාන්

02. ජේසුස් වහන්සේ මතෙව් තුමාව කැඳවන ලද්දේ,
   i. ඉරිදා පොළේ දී ය.
   ii. රේගු පොළේ දී ය.
   iii. දාදු පොළේ දී ය.
   iv. බස් නැවතුම් පොළේ දී ය.

03. පූජකවරුන්ගේ මංගල්‍යය ලෙස නම් කර ඇත්තේ,
   i. මහා බ්‍රහස්පතින්දා ය
   ii. පාස්කු ඉරිදා ය.
   iii. ගොබ් ඉරිදා ය
   iv. මහා සිකුරාදා ය.

04 ප්‍රසාද ස්නාපන පිළිවෙතේ දී භාවිත කරනු ලබන සංකේතයක් වන්නේ,
   1. කුරුසිය.
   ii පූර්ව තෛලය.
   iii. සුදු වස්ත්‍රය
   iv. මිදි යුෂ

05 පැවිදි පූජකතුමන්ලා ලබා ගන්නා වේදහාර වන්නේ,
   i. කීකරුකම, දිළිඳුකම, එකමුතුකම
   ii. දිළිඳුකම, පූජක බඹසර, කීකරුකම
   iii. කීකරුකම, එකමුතුකම, ව්‍රත ශුද්ධිය
   iv. කීකරුකම, ව්‍රත ශුද්ධිය, දිළිඳුකම

06 ඥාණගෝපාලයන් ලෙස හඳුන්වනු ලබන්නේ,
   i. තේවාචාරිවරුන් ය.
   ii. රාජගුරුප්‍රසාදීන් වහන්සේලා ය.
   iii. පූජාප්‍රසාදීන් වහන්සේලා ය,
   vi. පැවිදි සොයුරියන් ය.

07 කිතුනු විවාහයේ ලක්ෂණයක් වන්නේ,

i. ශුද්ධත්වය | ii. ඒකත්වය
iii. සාධාරණත්වය | vi. අපෝස්තලිකත්වය.

08 බොරු සාක්ෂි කීමට අප යොමු කරන්නේ,

i. නපුරේ බලවේගය ය. | ii. යහළු මිත්‍රයන් ය.
iii. සිත ය. | vi. හෘද සාක්ෂිය ය.

09 ශුද්ධ වූ පාවලු තුමා බොරු කීම අත් හැර දමා සත්‍යය කතා කළ යුතු බව අවධාරණය කරනු ලබන්නේ,

i. කොරින්ති ලිපියෙන් ය. | ii. ගලාති ලිපියෙන් ය.
iii. එපීස ලිපියෙන් ය. | vi. රෝම ලිපියෙන් ය.

10 සොරකම අතහැර යහපත් පුද්ගලයෙකු වීමට ජේසුස් වහන්සේට පොරොන්දු වූයේ,

i. සකේවුස් ය. | ii. අනනියස් ය.
iii. ආබ්‍රහම් ය. | vi. නිකදේමුස් ය.

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහනින් තෝරා හිස්තැන් පුරවන්න.**

11. සිරියාවේ රජතුමාගේ සෙන්පතියා වූ නාමන්ගේ කුෂ්ඨය ........................................ දිවැසිවරයා සුව කළේ ය.

12. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ පොර බදා ජය ගත් බැවින් ජාකොබ් තුමා ලැබූ නාමය වන්නේ ..........................................................ය.

13. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු වූ ජුදාස් වෙනුවට ............................................................ අපෝස්තුලුවරයෙකු ලෙස තෝරා පත් කර ගනු ලැබීය.

14. මම යමකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම්, ඔහුට ........................................................... ආපසු දෙමි.

15. පැවිදිවරුන්ට සහය වීම ගිහියන්ගේ ...........................................................
(සතර ගුණයක්, යුතුකමකි, මතියස්, එලීෂා, ඉශ්‍රායෙල්)

- **අංක 16 සිට 20 තෙක් දැක්වෙන ප්‍රශ්න සඳහා හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

16 ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වීමට පෙර අපෝස්තුලුවරුනට ධර්මදූත වගකීම් පැවරූ සේක. ( )

17 පැවිදි පූජකවරු රාජගුරුප්‍රසාදින් වහන්සේලා යටතේ රදගුරු පදවිය තුළ සේවය කරති. ( )

18 විවාහක යුවළ මරණය දක්වා ම එකට ජීවත් වීම අඛණ්ඩභාවය යි. ( )

19 දෙමව්පියන් වෙනුවෙන් දිනපතා යාච්ඤා කිරීම අපගේ යුතුකමකි. ( )

20. සත්‍යය විකෘති කිරීම සත්වන පනතට විරුද්ධ බව පෙන්වා දෙයි. ( )

(ලකුණු 2 ×20 = 40)

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 i. පුරාණ ගිවිසුමේ දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

ii. සුළු දිවැසිවරු දෙදෙනෙකු නම් කරන්න.

iii. ආබ්‍රහම්තුමාගේ කැඳවීමේ අංග දෙක නම් කරන්න.

iv. ආදිපිතෘ ජාකොබ් තුමා දුටු දර්ශන විම් දෙක නම් කරන්න.

v. ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී භාවිතා කරන සංකේත දෙක ලියන්න.

vi. පූජාප්‍රසාදීන් වහන්සේලා බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

vii. පැවිදි පූජක නිකායන් දෙකක් නම් කරන්න.

viii. පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් ඉටු කිරීමට සහය වන සමිති සමාගම් දෙකක් නම් කරන්න.

ix. ආශිර්වාදකාර බන්ධනයේ පාර්ශව දෙක නම් කරන්න.

x. කිතුනු දරුවෙකු ලෙස ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග දෙකක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20 )

02. i. පැවිදි පූජකවරුන්ට ලබා දෙන පූජක පොරොන්දු දෙක ලියන්න. ( ල. 2)

ii. පූජකවරයෙහි ධූරයන් තුන නම් කරන්න. (ල. 3)

iii. මීසම තුළ පූජාප්‍රසාදීන් වහන්සේලාට පැවෙරන වගකීම් පහක් ලියන්න. (ල. 5)

(2 + 3 + 5 = 10 )

03 i. කිතුනු විවාහයේ ලක්ෂණ දෙක නම් කරන්න. (ල. 2)

ii. දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටු විය යුතු යුතුකම් තුනක් ලියන්න. (ල. 3)

iii. ශුද්ධ වූ පවුලෙන් කිතුනු පවුලකට ලබා ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ල. 5)

(2 + 3 + 5 = 10)

04 i. පැවිදි නිකායන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 2)

ii. පැවිදි පූජකවරු ලබා ගන්නා වේදහාර තුන නම් කරන්න. (ල. 3)

iii. ගිහියන් ලෙස පැවිදිවරුන්ගේ සේවාවන්ට සහය විය හැකි ආකාර පහක් ලියන්න. (ල. 5)

(2 + 3 + 5 = 10 )

05 i. ශුද්ධ වූ සභාවට බොරු කියූ නිසා හදිසි මරණයට ගොදුරු වූ පුද්ගලයන් දෙදෙනා කවුරුන්ද? (ල. 2)

ii. සත්‍යගරුක සමාජයක් ගොඩනැගීමට ඔබට කළ හැකි දේවල් තුනක් ලියන්න. (ල. 3)

iii. "බොරු සාක්ෂි නොකියව" යන දේව පනත ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ල. 5)

(2 + 3 + 5 = 10)

06 i. සත්වන පනතින් තහනම් වන දේවල් දෙකක් ලියන්න. (ල. 2)

ii. අද සමාජය තුළ සොරකම සිදු වන අකාර තුනක් ලියන්න. (ල. 3)

iii. සාධාරණව වස්තුව ලබා ගත හැකි මාර්ග පහක් ලියන්න. (ල. 5)

(2 + 3 + 5 = 10 )

07 i. සතරවන පනතින් අපට ලැබෙන මඟ පෙන්වීම් දෙකක් ලියන්න.

ii කිතුනු දරුවෙකු වශයෙන් පාසල වෙනුවෙන් ඔබගේ යුතුකම් තුනක් ලියා දක්වන්න.

iii. නොයෙකුත් පීඩා මැද ඔබට සුරකීමට වෙර දරන ඔබගේ මව හා පියා දේව රැකවරණයට බාර කරමින් යාච්ඤාවක් නිර්මාණය කරන්න.